මගේ අංකය :- JSC/SPO/EB/2023(2025)

සියලුම,
මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්/මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්/ අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත.

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2023**

අංක 2088/26 හා 2018 සැප්තැම්බර් මස 11 දින දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 10.10, 15.3.1 වගන්ති සහ "ඌ" පරිශිෂ්ඨයෙහි 01.3 හි දැක්වෙන කොන්දේසි හා විෂය නිර්දේශය අනුව අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක III වන ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය කොළඹ දී පැවැත්වීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- ❖ උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක III ශ්‍රේණියේ 2023.12.31 දිනට පෙර පත්වීම් ලද නිලධරයන් පමණක් මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුස්සෝ වෙති.

- ❖ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක III වන ශ්‍රේණියේ නිලධාරීන් සේවයට බැඳී වසර 05 ක් ගත වීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.

02. විභාගය පිළිබඳ විස්තරය

| | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත්වීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු |
|---|---|---|---|---|
| 01 | ලඝු ලේඛනය හා යතුරු ලියනය (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි) | විනාඩි 50 | 100 | 40 |

03. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| | ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය | කාලය |
|---|---|---|---|
| 01 | ලඝු ලේඛනය හා යතුරු ලියනය (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි) | (1) ලඝු ලේඛනය හා යතුරු ලියනය (සිංහල) - විනාඩියකට වචන 70 ක අවම වේගයෙන් විනාඩි 05ක් තුළ කියවනු ලබන පාඨයක් ලඝු ලේඛනය කර එය විනාඩියකට වචන 07 ක වේගයෙන් යතුරු ලියනය කිරීම. | විනාඩි 50 |
| | | (2) ලඝු ලේඛනය හා යතුරු ලියනය (දෙමළ) - විනාඩියකට වචන 70 ක අවම වේගයෙන් විනාඩි 05ක් තුළ කියවනු ලබන පාඨයක් ලඝු ලේඛනය කර එය විනාඩියකට වචන 07 ක වේගයෙන් යතුරු ලියනය කිරීම. | විනාඩි 50 |
| | | (3) ලඝු ලේඛනය හා යතුරු ලියනය (ඉංග්‍රීසි) - විනාඩියකට වචන 80 ක අවම වේගයෙන් විනාඩි 05ක් තුළ කියවනු ලබන පාඨයක් ලඝු ලේඛනය කර එය විනාඩියකට වචන 08 ක වේගයෙන් යතුරු ලියනය කිරීම. | විනාඩි 50 |

(අයදුම්කරුගේ පත්වීම අනුව ඉහත (1), (2), (3) ප්‍රශ්න පත්‍ර අතරින් අදාළ ප්‍රශ්න පත්‍රය තෝරා ගත යුතුය.)

04. මෙම විභාගය පරිගණක භාවිතා කරමින් පැවැත්වීමට තීරණය කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය පරිගණක යන්ත්‍ර සපයනු ලැබේ.

05. සිංහල මාධ්‍යය අයදුම්කරුවන්ට තම අභිමතය පරිදි පහත සඳහන් අක්ෂර ක්‍රම (Font) වලින් එකක් භාවිතා කරමින් යතුරු ලියන පරීක්ෂණයට පෙනී සිටීමට අවස්ථාව සලසා ඇත.

i. Sandaya BOI
ii. Su-VijayaO
iii. Iskoola Pota

06. දෙමළ මාධ්‍යය අයදුම්කරුවන්ට තම අභිමතය පරිදි පහත සඳහන් අක්ෂර ක්‍රම (Font) වලින් එකක් භාවිතා කරමින් යතුරු ලියන පරීක්ෂණයට පෙනී සිටීමට අවස්ථාව සලසා ඇත.

i. Sharukeshi
ii. Kalaham
iii. Latha

07. ඉංග්‍රීසි මාධ්‍යය අයදුම්කරුවන්ට පහත සඳහන් අක්ෂර ක්‍රමය (Font) භාවිතා කරමින් යතුරු ලියන පරීක්ෂණයට පෙනී සිටීමට අවස්ථාව සලසා ඇත.

i. Times New Roman

08. මෙම පරීක්ෂණයෙන් සාමාර්ථයක් ලබා ගැනීම සඳහා අපේක්ෂකයින් 40%ක අවම ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

09. පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධරයන් විසින් ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාර වලදී නිලධරයන් විසින් විභාගයට පෙනී සිටීමේදි රු 250/- ක් විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතුය. මීට ප්‍රථම මෙම විභාගය සඳහා ඉල්ලුම් කර ඉදිරිපත් නොවූ නිලධරයන් දෙවන වතාවට ඉදිරිපත් වන සේ සලකා විභාග ගාස්තු ගෙවා විභාගයට අයදුම් කළ යුතුය. කවර කරුණක් යටතේ වුවද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. මෙම විභාග ගාස්තු **අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්** නමින් මහජන බැංකුව, වෙල්ල වීදිය ශාඛාවේ පවත්වාගෙන යන ගිණුම් අංක **297100199025039** ට බැර කර ලබා ගන්නා ලදුපත අයදුම් පත්‍රයේ අලවා එවිය යුතුවේ.

11. මේ සමඟ ඇති ආකෘති පත්‍රයට අනුව 11 ½ " X 8 ½ " ප්‍රමාණයේ ඝන කඩදාසියේ සකස් කොට සම්පූර්ණ කරන ලද අදාල නිලධරයන්ගේ අයදුම්පත්‍ර ඔබේ නිර්දේශය සමග **2025 මැයි 30** වන දින හෝ එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් මෙම කාර්යාලයට එවිය යුතුය. අයඳුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2023"** යනුවෙන් සඳහන් කළ යුතුය.

12. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර හා නිසි අයුරින් සම්පූර්ණ නොකළ අයඳුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

13. මෙම ලිපිය ඔබ අධිකරණයේ අදාල සියලුම නිලධරයන්ට දැන්වීමට කටයුතු කරන්න.

සී.එච්.ජී. ලියනගේ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

සී.එච්.ජී. ලියනගේ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12.

අත්/කලේ: එච්.එස්.සෝමරත්න
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

2025 මැයි මස 08 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.

## SPECIMEN APPLICATION FORM

**Efficiency Bar Examination for Officers in Court Stenographer Grade III of the Court Management Assistants' Service – 2023**

---

01. Name:

1:1 Name with initials Mr./Mrs./Miss: ..........................................................................
(In block letters)

1:2 Full name: ..........................................................................
(In block letters)

1:3 Full name: ..........................................................................
(In Sinhala/Tamil)

02. National Identity Card Number: ..........................................................................

03. Address:

3:1 Permanent address: ..........................................................................
(In block letters)

3:2 Official address ..........................................................................
(In block letters)

04. Contact Details

4.1 Mobile No-: .............................................

05. Date of Birth : Date ☐☐ Month ☐☐ Year ☐☐☐☐

06. Personal File No : EA/PF/3/.........

07. Date of appointment to the post of Court Stenographer Grade III : ........................

08. The category in which you sit for the examination:

☐

(Denote with "S" for Sinhala, "T" for Tamil and "E" for English)
Note : Candidates should select the relevant question paper according to his/her appointment.

09. Please give details of subject and year you sat the exam before:

| Year | Subject |
|---|---|
| | I. |
| | I. |

10. Subject / Subjects you are now offering to sit for:

(i) .............................................

(ii) ..................................

(iii) ..................................

11. (i) The value of payment made as Examination fee:..................................................
(ii) Name of the Bank and the Branch to which the payment was made: ..............
(iii) Number and date of the receipt: ..........................................................................

Affix the receipt here.

I state that the particulars given are accurate and I am entitled to sit for the Examination in the category mentioned in the paragraph 8 above. I certify that I am appearing for the Examination for the first time / I have annexed the receipt obtained after making the appropriate payment. I agree to be bound by the rules and regulations of the Secretary to Judicial Service Commission regarding conducting of the examination.

................................ ..........................................

Date Signature of the Applicant

Note: Applicant should sign before the Head of the Department/ Registrar of the relevant court.

---

**Attestation**

I hereby certify that Mr./Mrs./Miss......................................................................................................... who is a Grade III Court Stenographer is personally known to me and signed before me on ................................

........................................

Signature of the Registrar

Date: ........................................

Name: ......................................

Designation: ..............................

Address: ....................................

---

**Certificate of the Head of the Department**

I certify that,

01. The particulars furnished above were checked and found to be accurate.

02. The officer sits for this Examination for the first time/ has made the correct payment as Examination Fee.

03. The applicant is eligible to sit for this Examination.

Designation: ............................

Date: .........................................

........................................

Signature of the Head of the Department